# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## (ශ්‍රී ලංකා රාජ්‍ය අරමුදල් සපයන ව්‍යාපෘති)

### ආරක්‍ෂක අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා මීටර් 30.87 X 5.83 ප්‍රමාණයේ තනි මහල් පෙර සැකසූ වානේ නවාතැන් ගොඩනැගිලි 100 ක් සැලසුම් නිර්මාණය, පෙර සැකසීම, හා සැපයීම සඳහා වන ලංසු

**(යොමු අංකය - MOD/SLA/10/2021)**

1. ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත විස්තර කොට ඇති පරිදි "ශ්‍රී ලංකා යුධ හමුදුව සඳහා මීටර් 30.87X5.83 ප්‍රමාණයේ තනි මහල් පෙර සැකසූ වානේ නවාතැන් ගොඩනැගිලි 100 ක් සැලසුම් නිර්මාණය, පෙර සැකසීම හා සැපයීම" සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. මෙම කර්මාන්තය සඳහා වන ඇස්තමේන්තුගත දළ පිරිවැය (වැට් බදු සමග) රු. මිලියන 444.90 කි.

   සම්පූර්ණ කර්මාන්තය නිමා කිරීම සඳහා වන කාලසීමාව ගිවිසුම අත්සන් කළ දිනයේ සිට ලිත් දින 120 කි.

2. ජාත්‍යාන්තර තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය.
   - i. ව්‍යාපාර ලියාපදිංචිය
   - ii. VAT ලියාපදිංචිය
   - iii. ඉදිකිරීම් කර්මාන්ත සඳහා වන වාර්ෂික ධාරිතාවේ සාමාන්‍යය අවම වශයෙන් මිලියන 350 ක් විය යුතුය. (පසුගිය වසර 05 සඳහා)
   - iv. ද්‍රවශීල වත්කමේ අවම වටිනාකම රු. මිලියන 90 ට නොඅඩු විය යුතුයි.
   - v. විදේශීය මූලිකයන් නියෝජනය කරන දේශීය නියෝජිතයන් විදේශීය මූලිකයන් සඳහා ඇටෝර්නි බලපත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.
   - vi. වරලත් සිවිල් ඉංජිනේරුගේ මූලික වාර්තාව
   - vii. ඉංජිනේරු ද්‍රව්‍ය සඳහා වගකීම් සහතිකයේ කෙටුම්පතක්.

4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතා ලංසු දත්ත හා සේවායෝජක අවශ්‍යතාවන්හි ඇතුළත් කොට ඇත.

5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, යුධ හමුද මූලස්ථානයේ ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂ වෙතින් ලබාගත හැකි අතර (දුරකථනය : 011-2076213, 011-2073564) 2021-06-14 වෙනි දින සිට ඕනෑම රාජකාරි දිනයක 0900 පැය හා 1500 පැය අතර පහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්‍ෂාකර බැලිය හැකිය.

   ආරක්‍ෂක අමාත්‍යාංශය,<br>
   ආරක්‍ෂක මූලස්ථාන සංකීර්ණය,<br>
   ශ්‍රී ජයවර්ධනපුර,<br>
   කෝට්ටේ.

6. ආපසු ගෙවනු නොලබන රුපියල් හතළිස් දහසක (රු. 40,000/-) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2021-06-14 වෙනි දින සිට 2021-07-28 වෙනි දින දක්වා 0900 පැය හා 1500 පැය අතර කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ආරක්‍ෂක මූලස්ථාන සංකීර්ණය, ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් සිදු කළ යුතුය.

7. ලංසු 2021-07-29 වෙනි දින 11.00 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි, පිටපත් දෙකකින් යුතුව පහත සඳහන් ලිපිනයේ "**ප්‍රධාන ගණකාධිකාරී, ආරක්‍ෂක අමාතයාංශය, ආරක්‍ෂක මූලස්ථා සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ**" වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්‍ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම (2021-07-29 වෙනි දින 11.00 පැයේදී) එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

8. ලංසු, 2021-11-25 වෙනි දින දක්වා වලංගු විය යුතුය.

9. සියලුම ලංසු සමග රුපියල් හතළිස් පන් ලක්‍ෂයක (රු. 4,500,000.00) ක වටිනාකමින් යුත් (ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද වෙනස් කළ නොහැකි, කොන්දේසි රහිත හා ඉල්ලූ විට ගෙවිය හැකි බැංකු සුරක්‍ෂණයක්) ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. ලංසු ඇපකරය 2021-12-23 වෙනි දින දක්වා වලංගු විය යුතුය.

10. පූර්ව ලංසු රැස්වීම 2021-07-02 වෙනි දින 10.00 පැයට කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, යුධ හමුද මූලස්ථානයේ ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂ මණ්ඩල කාර්යාලයේදී පැවැත්වේ.

11. නිෂ්කාෂණ ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාම / සකස් කිරීම සඳහා ආරක්‍ෂක අමාත්‍යාංශ පරිශ්‍රයට ඇතුළු වන සෑම මොහොතකම දින තුනකට (03) (පැය 72 ට) පෙර තිල ඉල්ලීම් ලිපියක සහභාගී වන නියෝජිතයන්ගේ විස්තර (නම්, ජා.හැ.ප. අංකය / විදේශ ගමන් බලපත්‍රයේ අංකය, පැමිණෙන දිනය, අපේක්‍ෂිත ළඟාවීමේ වේලාව හා වාහන අංකය) ඉදිරිපත් කරන මෙන් ඔබෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. (ඊමේල් : procurement@defence.lk, ෆැක්ස් : 011-2390720) දුරකථනය : 011-2390719)

**සභාපති,**<br>
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**<br>
**ආරක්‍ෂක අමාත්‍යාංශය,**<br>
**ආරක්‍ෂක මූලස්ථාන සංකීර්ණය,**<br>
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**